ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2021 - 11 - 29 |

පැමිණිලි පාර්ශවය : ආර්.බී.දිපානි මිය.
130 බී. 1.
ජයන්ති මාවත.
කරන්වල.
පොකුණුවිට.

වගඋත්තර පාර්ශවය : පී.ඩී.හපුආරච්චි මයා.
හිටපු සහකාර ප්‍රාදේශීය ලේකම්.
හොරණ.

**පැමිණිලි අංකය : එච්.ආර්.සී/2793/15**

**පැමිණිල්ලේ කරුණු දැක්වීම :**

2015.07.09 දින වගඋත්තරකරු කාර්යාලයේ අස්ථානගතවූ ලේඛනයක් සම්බන්ධව පරීක්ෂණයකට තමාව කැඳවූ බවත්. තමා එහිදී ඔහුගෙන් කැඳවීමේ හේතුව විමසූ බවත්. තමා එසේ විමසීමට හේතුව වූයේ ඔහු විසින් තමාට අයුතු බැලපෑම් කර තිබූ නිසා බවද තමා මීට පෙර අවස්ථාවක ඒ පිළිබද ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර තිබූ බවත් එහිදී ඔහු "මැඩම් මට පරීක්ෂණය කරන්න දෙන්නේ නැහැ අතිරේක ලේකම්ලයි. ප්‍රාදේශීය ලේකම්ලයි දෙගොල්ලක් මේ කාර්යාලයට ඕනෙ නැහැ" කියා කෑ ගැසූ බවත් පසුව ප්‍රාදේශීය ලේකම්තුමිය තමා කැඳවා අසන ප්‍රශ්න වලට පිළිතුරු දීමට දැන්වූ බවත් පරීක්ෂණය ආරම්භ කොට ගෙන යාමේදී තමා කැඳවපු හේතුව පැහැදිලි කරන ලෙස ඔහුගෙන් ඉල්ලා සිටියදී ඔහු එකවරම නැගිට තමාගේ වම් පැත්තේ මුහුණට පාරක් ගැසූ බවත්. එවිට තමා නැගිට්ට බවත් එවිට නැවත තමාට පහරක් ගැසූ බවත් එම පහර තමාගේ කටට වැදුණු බවත් තමාගේ තොල පැලුණු බව තමාට දැනුණු බවත් මට ගහන්න එපා යැයි පවසා තමා දොර පැත්තට දුව ආ බවත් නැවත ඔහු දුව ඇවිත් තමාගේ ඔළුවට ගැසූ බවත් තමා



| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிரதான அலுவலகம்<br>Head Office | **14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04.**<br>14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04.<br>14, R. A. De Mel Mawatha, Colombo - 04. | සභාපති<br>தவிசாளர்<br>Chairperson | **011-2505451** | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | **011-2505541 / 74** | ඊමේල්<br>மின்னஞ்சல்<br>E-mail | **sechrc@gmail.com** |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | **94-11-2505580 / 81 / 82** | ලේකම්<br>செயலாளர்<br>Secretary | **011-2505521** | ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | **1996** | වෙබ්<br>இணையம்<br>Web | **www.hrcsl.lk** |

ක්ලාන්ත වී වැටුණු බවත් දිපිකා මිස් පැමිණ තමාව නැගිට්ට වූ බවත් තමා ඔහුගෙන් තමාට ගැසුවේ " සර්ගේ දේවල්වලට අකමැති වූ නිසාද? යන්න විමසූ බවත් එහිදී ඔහු තමාට ලිපිගොනු බහාලනය ගෙන ගැසූ බවත් එය තමාගේ ඇසට එය වැදුණු අතර පෙරලා තමා ඔහුට ගැසූ බවත් එවිට එම ස්ථානයට කාර්යාල කාර්ය සහායක ප්‍රේමලාල්, සංවර්ධන නිලධාරී රංජිත් යන කාර්යාල කාර්ය සහායක ලලිත්, සංවර්ධන නිලධාරී ගනේපත් යන අයවලුන් පැමිණි බවත් තමාට ක්ලාන්ත වී වමනය ගිය බවත් පසුව තමා රෝහලට ගිය බවත් මෙ සම්බන්ධව පොලිස් ස්ථානයේ පැමිණිලි කර පසුව එය අධිකරණයට ඉදිරිපත් කළ බවත් පසුව අධිකරණයේදී තමාගේ ස්වාමිපුරුෂයාගේ බලපෑම මත නඩුව ඉල්ලා අස් කරගත් බවත් දක්වා සිටී. ඒ අනුව තමාට සිදුවූ අගතිය පිළිබඳව මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කළ බව දක්වා සිටියි.

වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :

- ✓ තම කාර්යාලයේ පැමිණිමේ ලේඛනය අස්ථාන ගතවීම පිළිබඳ පරීක්ෂණයක් කිරීමට තමාට ප්‍රාදේශීය ලේකම් තුමිය දැන්වීම මත තමා අදාල පරීක්ෂණය ආරම්භ කළ බවත්.

- ✓ 2015.07.09 දින මූලික විමර්ශනය අවසාන කිරීම සඳහා එහි සැකයට පාත්‍ර වූ හා ව්‍යාජ අත්සන් යෙදීම හා පැමිණිමේ ලේඛනය අස්ථාන ගත කිරීම ද සම්බන්ධව මෙම පැමිණිල්ලේ පැමිණිලිකාරිය අතර සෘජු සම්බන්ධයක් නිරීක්ෂණය වූ බැවින්, මෙම පැමිණිලිකාරිය පරීක්ෂණ කමිටුවට කැඳවීමක් කළ අවස්ථාවේ දී ඇය තමාට ඇති චෝදනා මොනවාද යන්න දැනගත යුතු බව හා එසේ නොමැති වුවහොත් ප්‍රකාශ ලබා නොදෙන බව ආවේගශීලීව ප්‍රකාශ කළ බවත්.

- ✓ තමාට එහිදී මූලිකව චෝදනා කියවා දීමක් නොකරන බවත්, සිද්ධිය පිළිබඳ කරුණු සොයා බැලීමක් පමණක් කරන බව දැන්වූ නමුත් එය නොපිළිගනිමින් පැමිණිලිකාරිය අසත්‍ය වචන ප්‍රකාශ කරමින් තමාගෙන් කිසිදු ප්‍රකාශයක් ලබාගැනීමට ඉඩ නොතබන බව දැන් වූ බවත්.

- ✓ තමා මේ පිළිබඳ තම ඉහල නිලධාරියාට දැන්වූ බවත්, ඇය තමාට දැනුම් දුන්නේ පරීක්ෂණය ඉදිරියට කරගෙන යාමට බවත් ඒ අනුව තමා පැමිණිලිකාරියගෙන් ප්‍රකාශ සටහන් කර ගැනීම ආරම්භ කළ අවස්ථාවේ ඇය තමාගේ නිල නාම පුවරුව අතට ගෙන තමාට පහරදීමට උත්සාහ ගත් බවත්.

- ✓ ඒ අවස්ථාවේ තමා එම පහරදීම වැලකීමට උත්සාහ ගත් බවත් එහිදී තමාගේ හිස බිත්තියේ වැදුණු බවත් තමා රෝහල් ගත වූ බවත් පසුව රෝහලෙන් පිටව පැමිණි පසුව හොරණ පොලිසිය විසින් තමා අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ බවත්

- ✓ මේ සම්බන්ධව අධිකරණයේ වූ නඩුව අදාලව පැමිණිලිකාරිය විසින් සමථ වූ බවත් තවදුරටත් දක්වා සිටියි.

**නිරීක්ෂණ :**

දෙපාර්ශවයේ කරුණු දැක්වීම අනුව ආයතනය තුළ පැවති යම් පරීක්ෂණයකදී මෙම පාර්ශවයන් අතර යම් සිදුවීමක් සිදුවූ බවට කරුණු නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරිය දක්වනුයේ වගඋත්තරකරු තමා පරීක්ෂණය පිළිබඳ විමසීමේදී ඔහු තමාට පහරදුන් බවත් ලිපිගොනු බහාලනයෙන් ඇයට ගැසූ බවත් දක්වා ඇත. ඒ අනුව මෙම පැමිණිලිකාරිය රෝහල් ගතව ප්‍රතිකාර ගෙන ඇති බැවින් අදාළ වෛද්‍ය වාර්තාව කැඳවා ඇත. අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව අනුව රෝගී ඉතිහාසය ලෙස සහකාර ප්‍රාදේශීය ලේකම්තුමා පරීක්ෂණයක් සම්බන්ධව තමාගෙන් ප්‍රශ්න කරන අතරතුර තමාගේ මුහුණට පහරවල් හතරක් ගැසූ බවත් ලී Tray එකකින් ගැසූ බවත් දක්වා ඇත.

අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව තුවාලයන් දෙකක් දක්නට ලැබෙන බවට අධිකරණ වෛද්‍යවරයා සටහන් තබා ඇත.

1. 0.5cmක සීරීමක් උඩු තොලේ මැද කොටසේ සිට දකුණු පැත්තට වන්නට පිහිටා ඇති බව හා

2. 3cm x 3cm තැල්මක් දකුණු ඇසේ ඇති බව සටහන් කර ඇති අතර මොට ආයුධයකින් වූ තුවාල බවට වෛද්‍යවරයා සටහන් තබා ඇත.

ඉහත කරුණු අනුව පැමිණිලිකාරිය දක්වන පහරදුන් ආකාරය හා තුවාල සැසඳෙන බවට කරුණු නිරීක්ෂණය වේ.

වගඋත්තරකරුගේ ප්‍රකාශ සැලකීමේදී පැමිණිලිකරු දක්වනුයේ පැමිණිලිකාරිය ලිපිගොනු බහාලනය ඔසවා තමාට පහරදීමට උත්සාහ කිරීමේදී තමා ආසනයෙන් නැගිටිමින් එම පහරදීම වැළැක්වීමේ අදහසින් අත පසෙකට දමා ලිපිගොනු බහාලනය තල්ලු කළ බවත් ඒ අවස්ථාවේ තමාගේ ඔළුව පිටුපස බිත්තියේ වැදුණු බවත් පැමිණිලිකාරිය බිම ඇද වැටී සිටි බවට දුටු බවත් දක්වයි. ඒ අනුව වගඋත්තර පාර්ශවය එහිදී යම් සිදුවීමක් සිදුවූ බවට කරුණු පිළිගැනීමක් සිදු කරනු ලබන බව කරුණු නිරීක්ෂණය වේ. එමගින් පැමිණිලිකාරිය දක්වන කරුණු සනාථ කිරීමත් එම කරුණු දැක්වීම තුළින් සිදුවේ.

තවද මේ සම්බන්ධව ඇසින් දුටු සාක්ෂි ලෙස සිද්ධිය වූ දින කාර්යාලයේ සේවය කළ නිලධාරීන් කිහිප දෙනෙකු විසින් දිව්රුම් ප්‍රකාශ ලබාදී ඇති අතර එම දිව්රුම් ප්‍රකාශ වලට අනුව පහරදීමක් සිදුකළ බවට තුවාල මෙන් සිදුවී තිබුණු බවට කරුණු තහවුරු කර ඇත.

වගඋත්තරකරු දක්වනුයේ ඇය තමාට පහරදීමට ලිපිගොනු බහාලනය මගින් උත්සාහ කිරීමේදී තමා එය තල්ලු කිරීමේදී පැමිණිලිකාරියගේ මුහුණෙහි වැදුණු බවයි. නමුත් එසේ වැදුණේ නම් තුවාලයක් දෙකක් ඇතිවීමේ සම්භාවිතාව ඉතා අඩු බවට ද නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරිය ප්‍රකාශ කරන තවත් කරුණක් වන්නේ වගඋත්තරකරු විසින් ඇයට අයුතු බලපෑම් කළ බවයි. ඒ බව ඇයගේ මුල් පැමිණිල්ලේ සඳහන් කොට නැති අතර 2018.02.01 දින මානව හිමිකම් කොමිෂන්

සභාව වෙත ලබාදුන් ප්‍රකාශයේ ද සඳහන් කර ඇත. තවද මේ පිළිබඳ තම ස්වාමිපුරුෂයා මෙන්ම. ප්‍රාදේශිය ලේකම් වරයා මෙන්ම ඉඩම් අමාත්‍යාංශ සහකාර ලේකම් වරයා දැන සිටි බවත් තම ස්වාමිපුරුෂයා පවුල් ජීවිත වලට ගැටළු මතුවේ යැයි සිතා ඒ පිළිබඳකටයුතු නොකළ බවද පැමිණිලිකාරිය දක්වා ඇත. ඒ අනුව ලිංගික අඩන්තේට්ටම් පිළිබඳ වෙනත් කිසිදු සාක්ෂි සැපයීමක් පැමිණිලිකාරිය දක්වා නොමැත.

ඒ පිළිබඳ හිටපු ප්‍රාදේශිය ලේකම්වරිය දක්වා ඇත්තේ තමාට මෙම පැමිණිලිකාරිය මෙම සිදුවීමට අවුරුදු 1.1/2 කට පමණ පෙර වගඋත්තරකරු අයුතු බලපෑම් කරන බව පැවසූ විට තමා ඒ පිළිබඳ සාකච්ජා කර විසඳීමට දැනුම් දුන්න ද පැමිණිලිකාරිය එයට එකඟ නොවූ බවත් දක්වා ඇත.

එසේම මෙම පහරදීමේ සිද්ධියට අදාළව මහේස්ත්‍රාත් අධිකරණයේ පැමිණිල්ලක් ගොනු කළ පසුව පැමිණිලිකාරියගේ එකගත්වයක් මත 2016.02.08 දින සමථයට පත් කරගෙන ඇති බවට කරුණු තිරිකෂණය වේ.

ඒ අනුව සමස්ථ කරුණු සැලකීමේදී යම් සිදුවීමක් වගඋත්තර පාර්ශවය හා පැමිණිලිකාර පාර්ශවය අතර සිදුවී ඇති බව කරුණු තිරීක්ෂණය වන අතර වගඋත්තරකරු විසින් පහරදීමක් සිදු කර ඇති බවට කරුණු තිරීක්ෂණය වේ.

ඒ අනුව වධහිංසාව සම්බන්ධව සිදු කරන අර්ථ කථනය සැලකීමේදී යම් ශාරීරික හා මානසික පීඩණයක් යම් නිලබලයකින් යම් හේතුවක් උදෙසා සිදු කිරීමක් නිරීක්ෂණය වේ. 1994 අංක 22 දරණ වධදීම හා අනිකුත් කෲර අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම් වලට එරෙහි වූ සම්මුති පනත මගින් වධහිංසා පැමිණවීම එම පනත යටතේ වරදක් ලෙස දක්වා ඇත. එම පනතේ 12 වන වගන්තියට අනුව වෙනත් තැනැත්තෙකු හෝ තුන්වන තැනැත්තෙකු විසින් කරන ලද හෝ කරන ලදැයි සැක කෙරෙන යම් ක්‍රියාවක් සඳහා ඒ තැනැත්තාට දඬුවම් කිරීම සඳහා වුවද එකී වෙනත් යම් තැනැත්තෙකුට දැඩි ශාරීරික හෝ මානසික වේදනාවක් හෝ දෙන්නා වූ ද ක්‍රියාවක් වධදීම යන්නෙන් අදහස් වේ. ඒ අනුව මෙම සිදුවීම ද ඉහත ගණය ලා සැලකිය හැක.

ඒ අනුව ඉහත කරුණු අනුව වින්දිත වන ආර්.බී.දීපානි යන අය සම්බන්ධව 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

තවද ලිංගික හිංසනය පිළිබඳ පැමිණිල්ලේ තහවුරු කිරීමට පැමිණිලිකාර පාර්ශවය සමත් නොවූවද ආයතනයත් තුළ කිසිවෙකු ලිංගික හිංසනයට ලක් නොවීමට හා ආයතනය තුළ පවතින වෙනස් කොට නොසැලකීමේ ප්‍රතිපත්තිය කරුණු නිර්මාණය කළයුතු වන අතර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් හඳුන්වාදෙන ලද සේවා යෝජකයන් සඳහා මාර්ගෝපදේශ "සේවා ස්ථානයේදී සිදුවන ලිංගික හිරිහැර පිටුදැකීම පිළිබඳ ප්‍රතිපත්ති මාලාව" කෙරෙහි අවධානය යොමු කර ආයතනය තුළ ක්‍රමවේදයක් සැකසීම සුදුසු බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

නිර්දේශය :

1. වගඋත්තරකාර පාර්ශවයේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙහි වගඋත්තරකරුගේ විනය බලධරයා වන රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබේ.

2. ඉහත දැක්වූ ප්‍රතිපත්ති මාලාව අනුව කමිටු සකස් කර එහි ප්‍රගතිය කොමිෂන් සභාව දැනුවත් කිරීමට රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත පිටපතක් යොමු කරනු ලැබේ.

2021.12.31 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිපන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දියයුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සළකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

අනුසුයා ෂන්මුගනාදන්.
කොමසාරිස්
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.**

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ.නිමල් කරුණාසිරි
කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිපන් සභාව.